# 10 ශ්‍රේණිය
# ඉතිහාසය

## ක්‍රියාකාරකම් පත්‍රිකාව
## පිළිතුරු පත්‍රය

## ඒකකය 2
## ශ්‍රී ලංකාව ජනාවාස වීම -01





## ප්‍රාග් ඓතිහාසික ගල් යුගය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# ප්‍රාග් ඓතිහාසික ගල්යුගය

1.ඉතිහාසය පෙළ පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. ඒ සඳහා අදාළ ඡායාරූප හා වරහන තුළ ඇති උපකාරක ලද උපයෝගී කරගන්න.



හෝමෝසාපියන්

මානවයා

වසර 125000



ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු හමුවන කලාප

1 ඉරණමඩුසැකැස්ම

2 රත්නපුරය අවට මැණික් පතල්



වඳවී ගිය සතුන්ගේ ඇට කැබළි,



ශිලා මෙවළම්

හමු වීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප 6 හා ජනාවාස

| පරිසර කලාපය | ජනාවාස |
|---|---|
| අර්ධ ශුෂ්ක කලාපය | මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල, අලුගල්ගේ |
| පහතරට වියළි කලාපය | අලිගල, පොතාන |
| පහතරට අතරමැදි වියළි කලාපය | අත්තනගොඩ අළුලෙන , නිල්ගල , දානිගල, හේන්බැද්ද |
| තෙත් කලාපය | මානියන්ගම කිතුල්ගල බෙලිලෙන , මානියංගම , බටදොඹලෙන, පාහියංගල<br>බෙල්ලන්බැදිපැලැස්ස |
| කඳුකර<br>වියළි අතරමැදි කලාපය | රාවණා ඇල්ල මඩොල්සීම , බණ්ඩාරවෙල , මඩොල්සීම |
| ශුෂ්ක කලාපය | එළිෆන්ට්පාස් , පුන්කරි |

( ශිලා මෙවළම් , හෝමෝසාපියන් , ඉරණමඩුසැකැස්ම ,125000 , වඳවී ගිය සතුන්ගේ ඇට කැබළි,රත්නපුරය අවට මැණික් පතල්)

- **වීඩියෝ පාඩම , ඉතිහාසය පාඩම හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධ කාලරාමුව ගොඩනගන්න.**

| ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය<br>වසර 125000<br>සිට<br>ක්‍රි.පූ 600<br>දක්වා | ප්‍රාග් ඓතිහාසික ගල් යුගය<br>වසර 125000 සිට ක්‍රි.පූ 1800. දක්වා |
|---|---|
| | පූර්ව ඓතිහාසික යුගය<br>ක්‍රි.පූ 2400 සිට ක්‍රි.පූ 600 දක්වා |

- **ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



01)1.මෙම ඡායාරූපය හඳුනාගෙන නම් කරන්න.

ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්

2.මෙය කුමන යුගයකට අයත් ද.? ප්‍රාග් ඓතිහාසික ගල්යුගය

3.මෙම මෙවලම මඟින් සිදු කළ ප්‍රධානතම කටයුත්ත කුමක් ද?

දඩයම් කිරීම

4.මෙම මෙවලම් නිපදවීමට බහුලවම යොදාගත් පාෂාණ වර්ග දෙකක් නම් කරන්න.

තිරිවානා සහ කහඳ



02) 1.මෙම ඡායාරූපය හඳුනාගෙන නම් කරන්න.

මැටිඔරු සුසාන

2.මෙය කුමන යුගයකට අයත් ද.? ප්‍රාග් ඓතිහාසික ගල්යුගය

3. මෙය කුමන කාර්යයක් සඳහා භාවිතා කර ඇත් ද?

මලසිරුරු හෝ ඇටසැකිලි ආදාහනය

4.මේවා නිපදවීම සඳහා භාවිත කළ ප්‍රධානතම අමුද්‍රව්‍ය නම් කරන්න. මැටි

- පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඉදිරියේ ඇති වරහන තුළ එහි අංකය ලියන්න.

01. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් මෙවලම් ලැබී ඇති පතිරාජවෙල ප්‍රදේශයේ ඉරණමඩු සැකැස්මට අයත් බොරලු තට්ටුව කාල නිර්ණය අනුව වසර

1. එක් ලක්ෂ විසිපන් දහසක් පැරණි ය. 2. අසූ දහසක් පැරණි ය
3. තිස් අට දහසක් පැරණි ය 4. විසිඅට දහසක් පැරණිය ( 1 )

02. දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක්ද?

1. පසෙහි සාරවත් බව වැඩිවීම.
2. දඩයමට සුදුසු සතුන් හිඟවීම.
3. පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම.
4. ජන සංඛ්‍යාව වැඩිවීම හා ව්‍යාප්ත වීම. ( 3 )

03. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිදුවීමක් නො වන්නේ,

1. මැටි වළං භාවිතය ආරම්භ කිරීම ය.
2. තිරිවානා හා කහඳගල් භාවිත කර ක්ෂුද්‍ර ගල් මෙවලම් නිපදවීම ය.
3. ශාක හා සතුන් පුලුස්සා ආහාරයට ගැනීමය
4. සංචාරක ජීවිතයක් ගත කරමින් ස්වාභාවික ගල් ගුහාවල ජීවත් වීමය. ( 1 )

04. මළ සිරුරු දිරා යන තුරු වළලා පසුව ගොඩ ගෙන හිස් කබල සුමට කිරීම, එහි ගුරුගල් ආලේප කිරීම යන චාරිත්‍ර විධි පිළිබඳව සාධක ලැබෙන්නේ මින් කවර කාල පරිච්ඡේදයක දීද?

1. පූර්ව ඓතිහාසික යුගය 2. ප්‍රාග් ඓතිහාසික යුගය
3. මුල් ඓතිහාසික යුගය 4. ඓතිහාසික යුගය ( 2 )

06. ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබී ඇති වඩාත් ම පැරණි ස්ථානය ලෙස සැලකෙන්නේ,

1. කුරුවිට බටදොඹ ලෙනය. 2. කිතුල්ගල බෙලි ලෙනය
3. පාහියන්ගල ලෙනය 4. අත්තනගොඩ අළු ලෙනය ( 3 )

07. බුලත්සිංහල, කුරුවිට වැනි ප්‍රදේශවල පිහිටි ලෙන් වැදගත් වන්නේ ඒවා,

1. අනුරාධපුර - පොළොන්නරු යුගවලදී ආරක්ෂිත ස්ථාන වීම නිසාය.
2. පැරණි බෞද්ධ ආරාම ලෙස පැවතීම නිසාය.
3. බ්‍රාහ්මී අක්ෂර ලිපි ලිවීම සඳහා යොදා ගෙන ඇති නිසාය.
4. ප්‍රාග් ඓතිහාසික මානවයන්ගේ ජීවන තොරතුරුවලට අදාළ සාධක හමුවන නිසාය. ( 4 )

08.මෙරට ගල් යුගයට අයත් මෙවලම් හමු වූ අර්ධ ශුෂ්ක කලාපයේ පොළවේ මැටි සහිත වැලි පසකින් වැසුණු බොරලු තට්ටුව හැඳින්වූයේ මින් කවර නමකින් ද?

1. ඉරණමඩු සැකැස්ම 2. කුම්භීය නිබනන 3. නවනීත 4. පීඩන ශල්කනය ( 1 )

09.මිනිහාගල්කන්ද, බූන්දල, පතිරාජවෙල යන ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අයත් වන්නේ මින් කවරකටද?

1. පහත රට වියළි කලාපීය එළිමහන් කඳවුරු.

2. කඳුකර එළිමහන් දඩයම් ස්ථාන.

3. පහතරට වියළි කලාපීය ලෙන්.

4. වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු. ( 4 )

10.මෙවායින් ගල් යුගයේ මිනිසා මිටි හා ඇඹරුම් ගල් සකස් කර ගැනීමට භාවිතා කළ පාෂාණ වර්ගය වන්නේ කුමක් ද?

1. තිරුවානා ගල් 2.කහඳගල් 3. කළුගල් 4. ගුරුගල් ( 3 )

- පහත සඳහන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

02. (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් නම් කරන්න.

අර්ධ ශුෂ්ක කලාපය

පහතරට වියළි කලාපය

පහතරට අතරමැදි වියළි කලාපය

තෙත් කලාපය

කඳුකරවියළි අතරමැදි කලාපය

ශුෂ්ක කලාපය

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූයේ යැයි සැලකෙන වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන පැවති ස්ථාන දෙකක් සහ ගල් ගුහා වාසස්ථාන පැවති ස්ථාන දෙකක් නම් කරන්න.

ගල්ගුහා

පාහියන්ගල,බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන , පොතාන ,අලිගල

ඒළිමහන් වාසස්ථාන

මිනිහාගල්කන්ද, බුන්දල, පතිරාජවෙල , බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව ඔවුන් ජීවත් වූ විවිධ පරිසරයන්ට අනුව හැඩ ගැසී තිබූ ආකාරය නිදසුන් දෙකක් දක්වමින් පෙන්වා දෙන්න.

ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ආහාර සොයා යමින් සංචාරී දිවිපෙවතක් ගත කරන ලදී. එම යුගයේ මානවයා ආහාර සොයා දිනකට කාලෝ මීටර් 7 ක් පමණ දුරක් ඇවිද ගොස් ඇත් බව විශ්වාස කෙරේ. දඩයම ඔවුන්ගේ ප්‍රධානතම ජීවනෝපාය මාර්ගය වූ අතර ඊට අමතරව ආහාරයට ගත හැකි වනද්‍රව්‍ය රැස් කිරීමද සිදුව ඇත. මෙම යුගයේ මානවයින් තමන් ජීවත් වන පරිසරයෙන් පහසුවෙන් ලබා ගත හැකි දේ ආහාරයට ගෙන ඇත. තෙත් කලාපයේ විසූ මානවයින් එම කලාපයේ බහුලව ඇත් ගොඩබිම බෙල්ලන් බහුලව ආහාරයට ගෙන ඇති බවට සාදක හමු වේ. එසේම වියළි කලාපයේ ජීවත් වූ අය එම කළාපයේ බහුලව සිටින මුවා , තලගොයා වැනි සතුන් දඩයම් කර ආහාරයට ගෙන ඇත. මෙම යුගයේ මානවයා විසින් දඩයම් කළ සතුන් අතර ගවරා, කු`ඵ මීහරකා, ක`ඵ වළහා, වල්ඌරා, ගෝනා, තිත්මුවා, මීමින්නා, ඉත්තෑවා,හාවා, දඬුලේනා, හම්බාවා, මුගටියා, උරුලෑවා, වඳුරා, වලිකුකුළා, හබන්කුකුළා සහ තලගොයා වැනි සතුන් ප්‍රධාන වේ. පිෂ්ටය ලබා ගැනීමට භාවිත කළ ශාක ආහාර අතර වල්දෙල් සහ කැලෑකෙසෙල් ප්‍රධාන ය. මෙම යුගයේ පසුකාලීන මානවයා ආහාර සඳහා ලුණු එක් කර ගත් බවටත් ආහාර පුළුස්සාගෙන අනුභව කළ බවටත් සාදක කිතුල්ගල බෙලි ලෙනෙන් හමු වේ. එම සාදක මීට වසර 12500 පමණ පැරණි බව පුරාවිද්‍යාඥයින් ගේ අදහසයි. මෙම ලෙනෙන් කැලෑදෙල් ඇට පුළුස්සා අනභව කළ බවට සාදක හමු වේ.

(iv) ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ ජීවත් වූවකු මිය ගිය විට අනුගමනය කරන්නට ඇතැයි සැලකෙන අවමංගල්‍ය චාරිත්‍ර විධි මොනවාදැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

මෙම යුගයේ මානවයා ජීවිතයේ විවිධ අවස්ථා වලදී නොයෙක් අභිචාර විධි අනුගමනය කරන්නට ඇත. නමුත් මෙම යුගයේ අභිචාර විධි සම්බන්ධ සාදක හමුවන්නේ අභිචාර වධි සම්බන්ධයෙන් පමණි. සමස්ථයක් ලෙස බලන කළ මෙම යුගයේ පැවත ඇත්තේ මලසිරුරු හෝ ඇට සැකිළි වළ දැමීමේ ක්‍රමයකි. තම පවුලේ සාමාජිකයෙකු මිය ගිය විට තමා ජීවත් වූ ගල් ලෙනෙහි නොගැඹුරු වළක් හාරා සිරුර නමා වකුටු කර වළ දැමීම සිදු කර ඇත. මෙම මෙම යුගයේ අවමංගල අභිචාර විධියක් ලෙස අධ්‍යයනය කරනු ලැබුව ද ඇතැම් විට එය මෙම යුගයේ තාක්ෂණයේ හා පාරිසරාත්මක සාදක වල ගැටලුවක් ද විය හැකි ය. ගල් ලෙනක් තුළ මිනිස් සිරුරක් වළ දැමීමට තරම් විශාල වලක් හාරා ගැනීමට අපහසු වන්නට ඇත. එසේම මෙම යුගයේ මානවයින් වළක් හාරා ගැනීම ලී කැබළි , අං කැබළි වැනි සරල උපකරණ භාවිතා කර ඇත. එමගින් විශාල වළක් හාරා ගැනීම අපහසුය. කිතුල්ගල බෙලිලෙන ඇතුළත එලෙස මිහිදන් කළ පුද්ගලයින් 12 දෙනෙකුගේ ඇටසැකිලි සොයා ගැනිණි. විවෘත ස්ථානයක් වූ බෙල්ලන්බැඳිපැලැස්සේ ගල් යුගයට අයත් සොහොන් බිමෙහි ඇටසැකිලි 30 ක් තිබිණි.පාහියන්ගල ගල්ගුහාවෙන් අවධි කිහිපයකට අයත් පුද්ගලයින් 9 දෙනෙකුගේ ඇටසැකිලි කොටස් සොයා ගෙන ඇත.

ඇතැම් අවස්ථාවල සිරුර ගල් ලෙනෙන් පිටත වළදමා මාංශ කොටස් දියවී ගිය පසු ඇට සැකිල්ල ගොඩගෙන හිස් කබලේ ඉදිරියට නෙරා ආ ස්ථාන කළු ගලක උලා ඔප මට්ටම් කර ගුරු ගල් ආලේප කර වළ දමා ඇත ඒ පිළිබඳ සාදක පාහියංගල ගුහාවෙන් හමු වී ඇත. ඉහත ආකාරයටම ගුරු ගල් ආලේප කරන ලද දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද හිස් කබලක් රාවණා ඇල්ල ගුහාවෙන් හමු වී ඇත.

- සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

එළිෆන්ට්පාස්ට් , මානියන්ගම , බූන්දල , මිනිහාගල්කන්ද , පොතාන , මාන්තායි , ෆාහියංගල

රාවණාඇල්ල , බටදොඹ ලෙන , උඩමළල , අලුගල්ගේ , බෙල්ලන්බැඳිපැලැස්ස , අත්තනගොඩ අලුලෙන

